සිංහල පරිවර්තනය

උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක **16/2020**

මගේ අංකය NP/07/10/02/176
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
09.10.2020

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන් ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි III හා II වැනි ශ්‍රේණියේ තනතුරු දරණ නිලධාරීන් සඳහා වූ 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2017 (II) (2020)**

ඉහත සඳහන් තනතුර දරණ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය එම තනතුරු වලට ආදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 වැනි හා 01 වන ඇමුණුම හා 02 වන ඇමුණුම ප්‍රකාර **2020 වන වර්ෂයේ නොවැම්බර්** මාසය වන විට යාපනය හා වවුනියාවේ පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිමි. ප්‍රමාණවත් අයදුම්පත් නොලැබීම හෝ වෙනත් කුමක් හෝ කරුණු මත විභාග මධ්‍යස්ථානයක් අවලංගු කිරීමේ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා සතු වේ.

2.0 **සුදුසුකම්** :-

- නිලධාරියෙක් කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර පෙනී සිටිය නොහැකි ය. (ශ්‍රේණීන් දෙකටම)
- අයදුම්පත් **භාරගන්න** අවසාන දිනට අයදුම්කරුවන්,
  III වැනි ශ්‍රේණියේ නිලධාරීන් පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයටද,
  II වැනි ශ්‍රේණියේ නිලධාරීන් දෙවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයටද පෙනී සිටිමට සුදුසුකම් ලබති.
- එමෙන් ම මේ දක්වා මෙම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ද මෙම විභාගයට පෙනී සිටිමට සුදුසුකම් ලබති.

3.0 අයදුම්පත්‍රය

- අයදුම්පත්‍රය මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් තම අයදුම්පත්‍රය සකස් කරගත යුතු අතර, ඒ අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය අපේක්ෂකයින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2020.11.06** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල පාර, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.
- අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි III හා II ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා වන 1වැනි හා 2වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 (II) (2020)"** යනුවෙන් විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා ආදාල තොරතුරු සපයා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-

අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනම්පත.

(ii) වලංගු ශ්‍රී ලංකා ගමන් බලපත්‍රය. ( pass port )

(iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමේ බලතල තිරීක්ෂක සතුය.

5.0 **අයදුම්පත්‍ර :-**

- අංක 1 සිට 6 දක්වා ජේදයන් පළමුවන පිටුවටද අනෙක් ජේද දෙවන පිටුවටද ඇතුළත් වන පරිදි 'ඒ 4' ප්‍රමාණයේ කඩදාසියක පරිගණකය මඟින් සකස් කරගත් අයදුම්පත නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය.
- අයදුම්පත මේ සමඟ යොමු කර ඇති ආකෘතිය පරිදිම සකස් කර අයදුම් කළ යුතු අතර, අයදුම්පත්‍රයේ ජායා පිටපතක් හෝ අමතර පිටපත් භාර ගනු නොලබන බව අවවාද කරනු ලැබේ.
- ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ තොරතුරු සපයා ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඉදිරිපත් කර ඇති විභාග දැන්වීමේ සඳහන් වන ආකෘති පත්‍රයට අනුකූල ද යන්න තම අයදුම්පත පිළිබඳව අපේක්ෂකයා අවධානය යොමු කල යුතු අතර එහි ජායා පිටපතක් තමන් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත.

6.0 **විභාග ගාස්තු :-**

6.1 පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

6.2 විභාගයට පෙනී සිටි අනෙක් නිලධාරීන් විසින් එක් විෂයකට රු 250.00 ක් වටිනා මුදල් ඇණවුමක් ද එක් විෂයකට වැඩි විෂයන් වලට රු 500.00 ක් වටිනා මුදල් ඇණවුමක් ද **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් ගේ නමට හා යාපනය මධ්‍යම තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකිවන පරිදි** උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කන්තෝරුවකින් මුදල් ගෙවා ඇණවුමක් ඉදිරිපත් කළ යුතුයි.

6.3 මුදල් ඇණවුමේ ජායා පිටපතක් අයදුමකරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර මෙම ගාස්තු නැවත ගෙවනු නොලැබේ. එමෙන් ම වෙනත් විභාගයක් සඳහා මෙම ගාස්තුව මාරු කිරීමට අවස්ථාව නොලැබේ.

7.0 අයදුම්පත් යොමු කර ඇති නිලධාරීන්ට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබයි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටමට ඉඩදෙනු නොලැබේ. යම් අපේකෂකයකුට විභාගයට දින 03 ට පෙර ප්‍රවේශපත්‍ර නොලැබුනි නම් ඔහු **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ට** ඒ බවට පහත සඳහන් විස්තර සමඟ දන්වා එවිය යුතුය.

- ආයාචනා ලිපිය
- ඉල්ලුම්පත්‍රයේ පිටපත
- මුදල් අණුවුමේ සහතික කල පිටපත
- අයදුම්පත තැපැල් කල තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය හා දිනය
- ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ෆැක්ස් අංකයක් (Fax No)

8.0 මෙම විභාගයට අදාළ ප්‍රවේශ පත්‍ර ලැබී ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ආයතන සංග්‍රහයේ XII පරිච්ජේදයේ 19 වන වගන්තිය පරිදි කටයුතු කළ යුතුය.

9.0 නිලධාරීන් මෙම විභාගය සමත් වීම සඳහා පෙනී සිටින එක් එක් විෂයයන්ට සමස්ථ ලකුණු වලින් 40% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

10.0 මෙම විභාගයට පෙනී සිටි අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් නිකුත් කරනු ලැබේ.

11.0 **විෂය මාලාව :-**

1 වන හා 11 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ විෂමාලාවන් 1 හා 11 වන ඇමුණුමේ දක්වා ඇත